අද 2016 01.22

# දෙසැම්බර්, ජාතික පාරිභෝගික මිල දර්ශකය 1.1% කින් ඉහළට

■ ෂමීල පෙරේරා



2015 දෙසැම්බර් මස ජාතික පාරිභෝගික මිල දර්ශකය නොවැම්බර් මාසය සමග සැසඳීමේදී 1.1% ක ඉහළ යාමක් පෙන්වන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 113.2 ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, දෙසැම්බර් මාසයේ දර්ශකය නොවැම්බර් මාසයේ දර්ශකය (112.0) හා සංසන්දනය කළ විට 1.2ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.1% ක වැඩිවීමක් වාර්තා වේ. මේ සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.9% කින් හා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.1% කින් වැඩිවීම බලපා ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය 2015 ඔක්තෝබර් මස සිට අදාළ ලිත් මාසය අවසන් වී දින 21 පසු ප්‍රකාශයට පත්කරයි.

2015 නොවැම්බර් මාසය හා සසඳන විට දෙසැම්බර් මාසය සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස වැඩිවීම සඳහා එළවළු, අමු මිරිස්, සහල්, අලුත් මාළු, යෝගට්, බිත්තර, පොල්, සුදුළූණු සහ රතුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීම බලපා ඇත. එසේ වුවත් ලොකුළූණු, දෙහි, අර්තාපල්, වියළි හාල්මැස්සන්, කුකුල් මස්, මයිසූර් පරිප්පු, අඹ, කෙසෙල් සහ කිරිපිටි යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

2015 නොවැම්බර් මාසය හා සසඳන විට දෙසැම්බර් මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.1% ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' සහ 'ප්‍රවාහන යන කාණ්ඩවලට අයත් භාණ්ඩවල මිලෙහි වැඩිවීම බලපා ඇත. 'ප්‍රවාහන' කාණ්ඩයේ වටිනාකමේ වෙනස වැඩිවීම සඳහා ගුවන් ගමන් ගාස්තුවල වැඩිවීම මුළුමනින්ම බලපා ඇත. 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' යන කාණ්ඩයේ අඩුවීමක් පෙන්නුම් කර ඇත්තේ එල්.පී.ගෑස් සහ භූමිතෙල් සඳහා වූ මිල අඩු වීමයි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා දෙසැම්බර් මාසය සඳහා වාර්ෂික උද්ධමනය 4.2% ලෙස ගණනය කොට ඇති බවත්, පසුගිය නොවැම්බර් මාසය සඳහා එම අගය 4.8% ක් ලෙස වාර්තා වූ බවත් සඳහන් කළේය.

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO